රැවන් හඬ

සැදැහැවත් බුද්ධිමත් තාරුණ්‍යයේ අරුණැල්ල

යොවුන් දිවියට කිතුනු අත්වැල

ක්‍රිස්තු වර්ෂ 2026 සැප්තැම්බර් 13 වැනිදා

පව්කාරවූ මිනිසාට,
තම ජීවිතය පුදා දෙමින්
කමාව දානය කළ
සමිඳාණන් වහන්සේ
අපට ආරාධනා කරන්නේ,
උන්වහන්සේගේ
දයා කරුණාව තුළ
අපගේ සහෝදරයාට ද
අසීමිතව
කමාව දෙන්නටයි.

ජීවමාන පණිවුඩය ලොවට ගෙන ගිය ඇය

මග්දලේනා නම් ස්ත්‍රිය දුෂ්ට ආත්ම හත්දෙනෙකු ශරීර ගතවී ඇති නිසා දැඩි ලෙස කායික හා මානසිකව රෝගාතුරව සිටියාය. ජේසුස් වහන්සේ ඇයට අනුකම්පා කර සම්පූර්ණ සුවය ලබා දුන්සේක. මෙම ප්‍රාතිහාර්යාත්මක සුවයෙන් පසු එතුමිය තමා සතු කාලය, සම්පත් හා ශ්‍රමය වැය කරමින් ජේසුස් වහන්සේට උපස්ථාන කරමින් එතුමා පසු පසව සිටියාය. (ශූ.ලූක් 8:2)

ජේසුස් වහන්සේ කුරුසපත්ව සිටින අවස්ථාවේදී එතුමන් පසු පස සිටි ජුවාම් ගෝලයා හැර අනෙක් අය සැඟවී සිටියහ. එහෙත් මරිය මග්දලේනා තුමිය කිසිම බියක් නොමැතිව ජේසුස් වහන්සේගේ මරණය සිදුවන තෙක්ම කුරුසිය පාමුල රැඳී සිටියාය. (ජොහාන් 19:25) එය ජේසුස් වහන්සේ කෙරෙහි ඇය තුළ තිබූ අවංක මෙන්ම ගැඹුරු ආදරය පෙන්වන සාක්ෂියකි.

ජේසුස් වහන්සේගේ මරණයෙන් පසු ඉරුදින අළුයම මරිය මග්දලේනා තුමිය උන්වහන්සේගේ දේහය ආලේප කිරීමට සොහොන් ගෙය වෙත ගියාය. එහෙත් සොහොන් ගෙය හිස්ව තිබෙනු දුටු එතුමිය හඬන්නට වූවාය. එම අවස්ථාවේදී ජේසුස් වහන්සේ ඇය පිටුපසින් පැමිණ සිටි සේක.

මරිය මග්දලේනා තුමිය සිතුවේ තමා පිටුපස සිටින්නේ වත්තෙහි උයන් ගොව්වා කියායි. ජේසුස් වහන්සේ පිළිබඳ විමසූ එතුමියට 'මරියා' කියා ඇමතූ සේක. මරිය මග්දලේනා තුමිය ඒ සැනින් ජේසුස් වහන්සේ හඳුනා ගත්තාය. 'රුබ්බෝනි' එනම් ගුරුදේවයිනි යන අර්ථයෙන් ජේසුස් වහන්සේව පිළිවදන් දෙමින් වහා ඉදිරියට ගියාය. ජේසුස් වහන්සේ ඇයට පැවසුවේ මා අල්ලන්ට එපා තවම මම පියාණන් වහන්සේ වෙතට නොනැගෙමි. ඒ නිසා දැන් ඔබ මාගේ සහෝදරයන් වෙතට ගොස් මම උත්ථාන වූ බව පවසන්න යනුවෙනි. (ජොහාන් 20:11-17)

උත්ථාන වූ ජේසුස් වහන්සේ මුල් වරට දුටුවේ මරිය මග්දලේනා තුමියයි, එමෙන්ම ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ බවට පණිවුඩ ගෝලයන් වෙත රැගෙන ගියේද එතුමියයි. මේ කරුණු මුල් කරගනිමින් ශුද්ධවූ දෙවන පාවුළු පාප් තුමා එතුමිය අපෝස්තලුවරුන්ගෙත් අපෝස්තුලුවරිය ලෙස නිල වශයෙන් ඇගයීමට ලක් කරනු ලැබීය.

එතුමිය පසු කාලෙක තවත් පිරිසක් සමග ප්‍රංශයේ දකුණු ප්‍රදේශයට ගිය බව ජනප්‍රවාදවල සඳහන් වේ. සිය ජීවිතයේ වසර තිහක් එහි වූ ගුහාවක යාච්ඤාවෙන් හා භාවනාශීලිව ගත කළ බවත්, දිනකට සත්වතාවක් දේව දූතයන් පැමිණ දිව්‍යමය සංගීතයෙන් එතුමිය ශක්තිමත් කළ බවද එම ජනප්‍රවාදවල ඇතුළත්ව ඇත.

කෙසේ වෙතත් තම පව් ගැන පසුතැවීමේදී සහ කායික හා අධ්‍යාත්මික ශක්තිය ලබා ගැනීමටද කිතුනුවෝ එතුමියගේ මැදිහත් පිහිට අයදිති. උත්ථාන වූ ජේසුස් වහන්සේ මුල් වරට දර්ශනය වීමටත්, එතුමන්ගේ ජීවමාන පණිවුඩය ගෝලයන් වෙත රැගෙන යාමටත් මරිය මග්දලේනා තුමිය මහත් භාග්‍යයක් ලැබුවාය.

ශිරානි පෙරේරා

කවුරුත්ම නැති තැන සිදුවූ දෙය

සිතාවක ප්‍රදේශයේ සිට අප ගම්පළාතට ඇය පැමිණියේ ඇගේ දෙවන විවාහයෙන් පසුවය. ස්වාමිපුරුෂයා බෞද්ධයකු වූවත් ඇගේ දහමට විරුද්ධවූයේ නැත. සතියේ සෑම බදාදා දිනකම සදාසරණ නොවානයට යාම ඇගේ **පළිවෙතකි.**

ටික කලක් යනවිට දුප්පත්කමේ අඩියටම පත්විය. පදිංචි වී සිටි නිවස කුලියටදී අවිස්සාවේල්ල කඩුවෙල පාරේ හිතවතකුගේ ඉඩමක පුංචි පැල්පතක් සාදාගෙන ජීවත් විය. සුවාමි පුරුෂයාටද ස්ථීර රැකියාවක් නැත. එම ගෙවල් කුලියෙන් ජීවත්වීමට බැරිවිය. දිනකට ගනිමින් තිබූ ආහාර වේල් තුනද සීමාවිය.

බදාදා සවස දිනෙක දේවස්ථානයට යාමට සුදානම් වී පුතෙකුට කතා කළමුත් ඔහු කුසගින්නේ නිදාසිටිය හෙයින් ඇවිටිලි නොකළාය. මේ පුතා ස්වාමිපුරුෂයාගේ පළමු විවාහයේය. ඇය තනිවම දේවස්ථානය කරා පැමිණියා. සදාසරණ නොවානය හමාරවී යත්ම සුළු වර්ෂාවක් විය. කෙමෙන් කළුවරද වැටෙන්නට විය. ඇය ගමන් කරන මාර්ගයේ මංකොල්ලකරුවන් සිටින හෙයින් කරේ බැඳ සිටි චේන් පට ගලවා අතට ගත්තාය. එවෙලෙහිම මාර්ගයේ විදුලියද ඇණ හිටීය. දේවස්ථානයේ සිට ගෙදරට සැතපුමක් පමණය. මෙසේ පයින් යනවිට කකුලේ සීතලට සතෙකු පැටලීය. කකුල ගසාදමා වේගයෙන් ගමන් කළාය. නිවසට ගොස් බැලීමේදී අතේ තිබුන චේන් එක නැත. කකුලට වැටුනේ චේන් එක බව පැහැදිලිය. මුළු පවුලටම තිබුන එකම වටිනාදෙය මෙම චේන් එකය. ඇය නිවසේ සිට දෙවිමවුන්ට යාච්ඤා කළාය.

නැවත පසුවදාම සවස දේවස්ථානයට පැමිණ දෙවිමවුන් ඉදිරියේ යාච්ඤා කළාය. දේවස්ථානයේද කවුරුවත් නැත. එක සැණින්ම ඇන්ටි, ඇන්ටි ඔයාගේ චේන් එක ඊයේ නැතිවුනානේද, ආ මේ චේන් එක කියා හඬක් ඇසී පිටුපස බලනවිටත් ඇය නොහඳුනන කවුරුදෝ කෙනෙක් හිතාගත නොහැකි ලෙසින් ඇගේ අතට චේන් එක දී ඇත.

හරි ලස්සනයි අපගේ දෙව් මැඳුර
ඉසිකෝමාන නැහැ අප අතර
එකමුතු වෙලයි කෙරුවේ පිළි සකර
තව තව මෙන්න මෑණියනි අපහට සරණ

බැසිල් කාරියවසම්

අසීමාන්තික සිත් වේදනාව

අප ස්වාමින් වහන්සේ හැම දෙනාගේම හදවත්වලටම ඉතා උතුම් පාඩම්, ගෙන එනවා. බද්ධ වෛරය ඔස්සේ පාතාලය වෙත පියවර තබනවාද? සමාව දීමෙන් සදාතන ජීවිතය අයිති කර ගෙන, සුර පුර වෙත ගමන් කරනවාද?. සම්දාණන් වහන්සේගේ කරුණාව, සමාවදීම අපේ කර ගැනීමට මේ ලෝකය තුළ ගෙවන කෙටි කාලයේදී උත්සහ කරමු. මෙදින කියවන පළමු දේව ප්‍රකාශනය : සිරාක් 27:30, 28:7 දක්වා කොටස ආරම්භ කරන්නේ 'බද්ධ වෛරය හා කෝපය පිළිකුල් දේවල්ය යනුවෙනි. අසල්වැසියාට ඔබ කරන වරදට සමාව ඉල්ලන්න. මෙන්න සමහර දෙනෙකුට ඉතාම අපහසු අවස්ථාව. හිතා බලන්න. ජරාව ගිල ගත්තොත් එය වමාරන්නට වෙනවාමයි. එසේ නැතහොත් මරණයට පත්වීමටත් ඉඩ ඇත. කට සෝදාගෙන වරදකළ සහෝදරයා හෝ සහෝදරිය වෙතට යන්න. එසේ කිරීමෙන්, අතිශයින්ම කරුණාවන්ත දෙවි මහෝත්තමයාණෝම ඔබ වැළඳ ගන්නා බව අදහා ගන්න. මෙය හැම ආගම් ධර්මයන්ටම පොදු උතුම්ම දහම වේ. අපි සැම මැරෙන මිනිසුන් වෙමු. ඒ අවසාන මොහොත සිහි කරමු. ප්‍රේමය හා දයාවේ කිරුලෙන් සරසා ගනිමු. මෙයයි ජීවිත අපේක්ෂාව. ඔව් දෙව් මහෝත්තමයාණෙනී, ඔබගේ කුඩාරමේ සැරිසැරීමට අපට වරම් දුන මැනව. මෙදිනට නියමිත පිළිතුරු ගීය ඔස්සේ කියවෙන එක් වගන්තියක් මෙලෙස අපටම කියා ගනිමු. නැගෙනහිරින් බටහිර ඈත්ව තිබෙන්නාක් මෙන් එතුමාණෝ අපේ පාපයන් දුරු කරන සේක.

වෛරය දුරු කිරීමෙන් ලබා ගන්නා සැහැල්ලුව, සැනසීම හා ප්‍රීතිය ගැන හිතන්න. මෙදිනට නියමිත දෙවන දේව ප්‍රකාශනය : රෝම 14:7-9 දක්වා වේ. මෙහි ආරම්භක වාක්‍යය වනුයේ කිසිවෙකු තමා උදෙසා ජීවත් වන්නේවත්, තමා උදෙසාම නසින්නේවත් නැත. ඒ නිසා ඔබ අපි සැම දෙනාම අප ස්වාමින් වහන්සේ වෙනුවෙන් ජීවත් වෙමු.

ස්වාමින් වහන්සේ අපි වෙනුවෙන් ජීවත් වී අප වෙනුවෙන් මරණයට පත්වී මේ අජරාමරයෙන් අප මුදා ගත්තේ ස්වර්ගීය ඔටුන්න හිමිකරදීමටයි, මෙදිනට නියමිත සුපුවත මඟින් "ස්වාමින් වහන්සේ කතා කළ මැනව. ඔබගේ මෙහෙකරුවා සවන් දී සිටියි. සදාතන ජීවන වචනය ඇත්තේ ඔබ වහන්සේ වෙතය.

එසේ නම් දේව හඬට ඇතුළාන්ත
යෙන්ම සවන් දී ඒ අනුව ජීවත් වෙමු.

මෙදිනට නියමිත සුවිශේෂය : මතෙව් 18: 21-35.

මෙම කොටසින්
කියවෙන්නේද සහෝදරයාට
විරුද්ධව කරන පාපය ගැනය. එකල පේදුරු උන්වහන්සේ වෙතට අවුත්, ස්වාමිනී,
මට විරුද්ධව පව් කරන මගේ සහෝදරයාට
සත් වාරයක් දක්වා සමාව දීම යෙහෙකැයි දැයි ඇසීය. එයට පිළිතුරු වශයෙන්
සත්වාරයක් නොව සත් වාර සැත්තෑව කැයි කියනු ලැබීය. එය තවදුරටත් තහවුරු
කරන පිණිස අප ස්වාමීන්
වහන්සේ මිනිස් මට්ටමේ එන උපමා කතා දෙකක් ගෙන එය විස්තර කළේය.
රාජ්‍යයක් සිය
දාසයන් තමාට ඇති ණය ගනුදෙනු ගණන් බලා රුපියල් දෙකෝටියක් පමණ වූ
අධික ණයක් ඇති කෙනා
ගෙන්වාගෙන, ප්‍රශ්ණ කළ අතර ණය ගෙවීමට බැරි වුයෙන් දණින් වැටී සමාව
ඉල්ලුවත් බිරිඳ හා දරුවන් ද විකුණා ණය ගෙවිය යුතු බව
පැවසුවත් තව තව දණින් වැටී සමාව ඉල්ලීමෙන් අනුකම්පාසහගත හදවතින්
ඔහුට සමාව දුන් අතර, ඒ දාසයා තම දුෂ්ට චේතනාව වෙනස් නොකොටම, මගදී
හමුවූ සුළු මුදලක් ණය වී තමාගේ දාසයෙක් බෙල්ලෙන් අල්ලාගෙනම තමාට
ගෙවිය යුතු සම්පූර්ණ ණය ගෙවන ලෙස තාඩන පීඩන කළේය. මේ ගැන දැනගත්
පළමු ස්වාමියා ඔහුව වහාම කැඳවා, මෙසේ පැවසීය. නුඹේ ඉල්ලීම නිසා මම ඒ
ණය සියල්ල නුඹට කමා කළෙමි. මා නුඹට අනුකම්පා කළාක් මෙන් නුඹත් නුඹේ
සහකාර දාසයන්ට අනුකම්පා කළ යුතුව තිබුණා නොවේදැ යි ඇසීය. කෝපයට
පත් ස්වාමියා ඔහු තමාට ගෙවිය යුතු සම්පූර්ණ ණය ගෙවන තෙක් වධකයන්ට බාර
දුන්නේය. මෙන්න සමාව නොදීමෙන් ඇතිවන සිත් වේදනාව. මෙයට සීමාවක් නැත.

සදාතන ජීවනදායක වචනය ඇත්තේ දෙව් සමිඳුන් තුළය. එය ඔබ අප සැම තුළටම ගලාබසිමින් ප්‍රේමය එකමුතු කම, සමාවදීම ඔස්සේ ඵලගන්වනු ලැබේවා!

ගරු මේරි ලිනට් පෙරේරා පැවිදි සොයුරිය

පාසල් දරුවන් ගුණගරුක වන්නේ කලාව හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් තුළිනි

අති උතුම් ජේ.ඩී. ඇන්තනි ජයකොඩි රදගුරු හිමිපාණෝ පවසති

දෙමාපියන් බොහෝ විට තම දරුවන් පිළිබඳව අවධානයකින් පසු වන්නේ ඔවුන් පාසලේදී විභාගවලින් හොඳින් සමත්වීම පිළිබඳව පමණකි. එම දරුවන් අනාගතයේදී යහපත් වටිනාකම්වලින් හෙබි සංවේදී, ගුණගරුක පුරවැසියන් බවට පත්වන්නේ පාසලේදී ඔවුන් යොමුවන කලා කටයුතු හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් තුළින් "අගරදගුරු පදවි සහයක රදගුරු අති උතුම් ජේ.ඩී. ඇන්තනි ජයකොඩි හිමිපාණන් එම අදහස් ගෙන හැර දැක්වූයේ පසුගියදා මීගමුව සාන්ත මරියා මහා විදුහලේ පැවති කලා උලෙළේ ප්‍රධාන ආරාධිතයා ලෙස මුලසුනේ කතාව සිදුකරමිනි.

මීගමුව මහ වීදිය මීසම් සේවක ගරු සාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමාද මෙම අවස්ථාවට සහභාගි වී සිටි අතර, මීගමුව සාන්ත මරියා මහා විදුහලේ අදියුරු ගරු සුදත් හේමන්ත ප්‍රනාන්දු පියතුමාගේ මගපෙන්වීම යටතේ ප්‍රාථමික අංශයේ විදුහල්පතිනි ගරු මේරි නිමේෂා පැවිදි සොහොයුරිය හා උප විදුහල්පති ගරු සුරංග වර්ණකුලසූරිය පියතුමා සමග ගරු සන්දීප් රුක්ෂාන් පැ.තු.නි. පියතුමා ඇතුළු විදුහල් ආචාර්ය මණ්ඩලය විසින් මෙම කලා උලෙළ සංවිධානය කොට තිබුණි. විදුහල් දරුවන්ගේ නර්තන, ගායන වාදන ඇතුළු විවිධ අංග වලින් මෙම උලෙළ රසවත්වී තිබූ අතර විදුහල් දරුවන්ගේ දෙමාපියන්ද මීට එක්වී සිටියහ. - **ප්‍රියංග සම්පත්**

ගණේමුල්ල සැනසිලිදායක දේවමාතා වාර්ෂික මංගල්‍යය

ගණේමුල්ල සැනසිලිදායක දේවමාතා දේවස්ථානයේ 55වැනි වාර්ෂික මංගල්‍යය පසුගියදා උත්කර්ෂවත් අයුරින් පැවැත්වුණි. අගරදගුරු පදවි විශ්වාස ප්‍රවර්ධන කණ්ඩායම් අධ්‍යක්ෂ ගරු දිනේෂ් කීර්තිසිංහ පියතුමාගේ ප්‍රධානත්වයෙන් මංගල්‍ය මහා පූජාව පැවැත්වූ අතර මීසම් සේවක ගරු රෝෂන් ජනක පියතුමා හා මීසම් ධර්ම සේවා සභාව මංගල්‍ය වැඩකටයුතු සංවිධානය කළහ. මංගල්‍ය පූජාවෙන් අනතුරුව දේවමාතා ප්‍රතිමාව රැගත් පෙරහැර ගණේමුල්ල නගරය වටා ගමන් කළ අයුරු.

සටහන : සුරේෂ් දර්ශන, සේයා : සනුජ පෙරේරා

රුවන් පුදීපය පුවත්

දඬුගම් ඔයේ මරිය ගොරෙත්ති මංගල්‍ය පෙරහැර

දෙහියාගාත මීසමට අයත්, කිඳිගොඩ ශුද්ධවූ මරිය ගොරෙත්ති මුනිවරියගේ දේවස්ථානයේ 69 වන වාර්ෂික මංගල්‍යය ඉතා උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී. එදින ප්‍රතිමාව රැගත් බෝට්ටු පෙරහැර ඉතා හරසරින් මෙවරත් දඬුගම ඔයේ සිට සීදුව පාලම දක්වා ගමන් කළේය. එදින සියලු කටයුතු මීසම් සේවක ගරු රසික ලෝරන්ස් පියතුමන්ගේ අනුශාසනයෙන් කිඳිගොඩ සංඝයේ එකමුතුවෙන් සිදුවිය. - **තුෂාර මනෝජ් ද සිල්වා**

මහනුවරට පැමිණි අති උතුම් අල්පොන්සෝ රයිමෝ රදගුරු හිමිපාණන් පිළිගැනීම මහත් හරසරින්

පසුගියදා මහනුවර පදවියට ඉතාලියේ සිට පැමිණි අති උතුම් අල්පොන්සෝ රයිමෝ රදගුරු හිමිපාණන්, මහනුවර රදගුරු අති උතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් මහනුවර මීසම් සේවක ගරු සුදත් රෝහණ පෙරේරා, සහයක ගරු මයිකල් ජෝන් පියතුමන් සමග මීසම් සංඝය විසින් පිළිගන්නා ලදී.

තුති පිදීමේ දිව්‍ය යාගය අති උතුම් වැලන්ස් මෙන්ඩිස් රදගුරු හිමිපාණන් පැවැත්වූ අතර, අති උතුම් අල්පොන්සෝ රයිමෝ රදගුරු හිමිපාණන් සමග ගරු සුදත් රෝහණ පෙරේරා, ගරු මයිකල් ජෝන්, ගරු ජේ. රොනින්සන්, ගරු තරිඳු දෙව්ෂාන්, ගරු ශාමල් රසික යන පියතුමන් ඊට හවුල් වූහ.

- සටහන : වික්ටර් දෙහිපිටිආරච්චි, ඩොරති සේවියර්, සේයා : මැතිව්

සතුට හා සැනසීම

සැබෑ සතුට ලැබෙන්නේ අවශ්‍ය හැමදේම ලබා ගැනීමෙන් නොව තණ්හාව අවම කරගෙන දැන් අයිති දේ අගය කිරීමෙනුයි. බාහිර කාරණාවලට වඩා අපේම සිතුවිලි තමයි අපට දුක දෙන්නේ. එකම ප්‍රශ්නයට දෙදෙනෙක් මුහුණ දුන්නොත් එක්කෙනෙක් විඳවන අතර අනෙකා සන්සුන්ව සිටී. වෙනස තියෙන්නෙ හිතන විදියේය. දැඩි ලෙස ඇලීම හිතේ තියෙන සැනසීම හොරා ගන්නේය. ආදරණීය පුද්ගලයන්, බඩු මුට්ටු හෝ බලාපොරොත්තු තදින් බදාගෙන ඉන්න තරමට ඒවා නැතිවෙයි කියන බිය වැඩිවේ. සැබෑ සැනසීම තියෙන්නේ මේ **වර්තමාන මොහොතේ අප ධනාත්මකව සිතීමෙන් පමණි. අතීතය ගැන සිතුවොත් පසුතැවීම හා කලකිරීම ඇතිවන අතර අනාගතය ගැන හිතුවොත් බය ඇතිවේ.**

අන්‍යයන් කෙරෙහි කෘතඥතාවය දැක්වීමෙන් හිතට මහත් සහනයක් දැනෙනවා. තමන්ට දැනටමත් ලැබිල තියෙන දේ අගය කිරීමෙන් හිතේ තියෙන අනෙකුත් අඩුපාඩු නැතිවෙලා යන්නේය. අන් අය එක්ව ඔබේ ජීවිතය සසඳන්න ගියොත් හා ඔබ පිළිබඳව සෘණාත්මකව සිතා අනුන්ගේ ජීවිත දෙස බලන්න ගියොත් ඔබට තියෙන වටිනා ගුණයහපත් ගතිගුණ හා සිරිත් විරිත් පමණක් නොව භෞතික වටිනා දේවල්වල අගයද අමතක වී ඔබේ සතුට නැතිවෙන්නේය. මෛත්‍රීය, කරුණාව සහ ආදරය ලබන කෙනාට පමණක් නොව දෙන කෙනාටත් ලොකු සැනසීමක් ලබා දෙනවා. කේන්තියෙන් සහ වෛරයෙන් කිසිදිනෙක සිතට සැනසීමක් ලැබෙන්නේ නැහැ.

මේ ලෝකේ කිසිම දෙයක් ස්ථිරව පවතින්නේ නැහැ. සතුට හා දුකත් ඒ වගේ ක්ෂණයෙන් වෙනස් වේ. මෙලොව සියලු දේටම අවසානයක් ඇති බැව් තේරුම්ගත්විට කිසිම පුද්ගලයකුට හෝ ද්‍රව්‍යයකට ලෝබ නොවී අත්හැරීමට හැකි අයුරින් ජීවත්වීමට පුලුවන. ඔබේ ජීවිතය තීරණය කරන්නේ ඔබේම සිතුවිලිය. නිවුණු සිතකට කොතැනත් සැනසීමෙන් ඉන්න පුලුවන. නොසන්සුන් සිතකට සියලු සම්පත් මැදත් දුකය. සතුට කියන්නේ කොහෙන්වත් සොයා ගන්න පුලුවන් දෙයක් නොවේ. සතුට ලබාගන්න තමන්වම ප්‍රගුණ කළ යුතු වේ. යහපත් සිතුවිලි, කරුණාව, ප්‍රඥාව සහ අත්හැරීම තුළින් සැබෑ සතුට සිත ඇතුලේ වැඩේ. බොහෝ දෙනෙක් කරන ලොකුම වැරැද්ද සල්ලි වැඩිපුර ලැබුණම හොඳ සහකරුවකු හෝ සහකාරියක ලැබුණම, ජීවිතය පහසු කරගන්න යාන වාහන, නිවාස සහ ගෘහ උපකරණ ලැබුණම තමන්ට සතුට ලැබේ කියා හිතන එකය. හැබැයි ඒ සියලු දෙය තියෙන අය සමග කතාකර බැලුවොත් ඔවුනට ඇති අසහනය ඔබට තේරුම් ගත හැකිය.

සතුට හා සැනසීම යනු අනාගතයේදී ලැබෙන දෙයක් නොවේ. එහෙත් සතුට පස්සෙන් පන්නන එක නතර කරලා හොඳ සිහියෙන් හා පිරුණු හදවතින් වර්තමානයේ ජීවත් වන්නට පටන් ගන්නා මොහොතේම සැබෑ සතුට හා සැනසීම ආරම්භ වේ.

ආනන්ද ජයකොඩි - කැපුන්ගොඩ

තරුණ ජීවිත ප්‍රගමනයේ ආධ්‍යාත්මික තෝතැන්න

රැවන් පුද්පය

ඔබේ සිතැඟි සංකල්පනා, නිර්මාණ හෝ හරවත් ලිපි සහ මීසමේ, දේවස්ථානයේ තරුණ ක්‍රියාකාරකම් පිළිබඳ ඡායාරූප සමග ප්‍රවෘත්ති

0777 186571

අංකයට
Whatsapp කරන්න.

නේපාලයේ බේදවාචකයට කරිටාස් දයාවේ හස්තය දිගු වෙයි

නේපාලයේ ග්ලැසියර් කඩා වැටී ඇතිවූ ගංවතුර බේදවාචකය සමගින් එරට කරිටාස් - කතෝලික සමාජ සේවා හස්තය දිවා රෑ නොබලා විපතට පත් දහස් සංඛ්‍යාත පවුල් වලට විවිධ සේවා සපයමින් සිටී. මෙහිදී මළ සිරුරු සොයා ගැනීමේ සිට ඒවා මිහිදන් කිරීමේ කටයුතු වලදී බොහෝ තැන්වල පවුල් පිටින් විනාශ වී යෑම නිසා අදාල නීතිමය තත්ත්වයන්ද සම්පාදනය කර ගැනීමට සිදුවූ ඇතැයි වාර්තාවේ. නිල සංඛ්‍යා ලේඛන වලට වඩා විපතට පත් සංඛ්‍යාව ඉතා වැඩිවනු ඇති බවට සැකයක්ද පවතී.

කරිටාස් නේපාල් අධ්‍යක්ෂ ගරු සිලාස් ක්‍රිෂ්ණ බොගාටි පියතුමා කතෝලික සභාව මේ බේදවාචකය සමග පූර්ණ කාලීනව මේ හා බද්ධ වී කටයුතු කරමින් සිටින බවත්, මළමිනී මිහිදන් කිරීමට අවශ්‍ය බෑග් දහස් ගණනක්ද, තාවකාලික හදිසි නිවහන්, සෞඛ්‍යාරක්ෂිත මෙවලම් දහස් ගණනක්ද බෙදා දී ඇති අතර හදිසි විපත් සහනාධාරයක් ලෙස නේපාල රුපියල් 15,000 (දළ වශයෙන් ඇමෙරිකා ඩොලාර් 110) බරපතල ලෙස විපත්පත් පවුල් වෙත ලබාදෙමින් සිටින්නේ යැයි අනාවරණය කළේය.

නේපාලයේ කතෝලික සභාවට රදගුරු හිමිපාණන් නමක තවමත් ලැබී නොමැති තත්ත්වය මත ගරු සිලාස් ක්‍රිෂ්ණ බොගාටි පියතුමා නේපාල අපෝස්තලික අනුපදවියේ අපෝස්තලික පරිපාලක ලෙසද කටයුතු කරයි. මේ අතර නේපාලයේ විපත් පත් ප්‍රදේශවල මුළුතැන් ගෙවල් 50 ක් පවත්වාගෙන යමින් 300 කට අධික පිරිසකට දිනපතා ආහාර ලබාදීමටද කටයුතු කරමින් සිටින බැව් ගරු පියතුමා අනාවරණය කළේය. මේ අතර නේපාලයට සිද්ධ වී පවතින විනාශයේ තරම තවමත් හරියට ගණන් බලා නැති අතර පාලම් 19 ක් මහමාර්ග ඇතුලවූ වෙනත් ප්‍රධාන යටිතල පහසුකමත් විනාශ වී යෑමේ තත්ත්වය හදිසි ආධාර ලබාදීමට මෙන්ම බේදවාචකයෙන් දිවි ගලවා ගත් අය සොයා යෑමේදී බරපතල අවහිරතා ඇති කරමින් තිබේ.

චීනය සහ ඉන්දියාව ගලවා ගැනීමේ මෙහෙයුම් වලට උරදී සිටින අතර තවදුරටත් නායයෑම්, හදිසි ගංවතුර තත්ත්වයන් ඇතිවීමේ අවදානමත්, ශීත සෘතුව උදාවෙමින් තිබෙන පසුබිමක ඊට ඔරොත්තු දෙන ඇඳුම් පැළඳුම් හා තාවකාලික නිවහන් සති කීපයකින් අවශ්‍ය වනු ඇතැයි ගරු සිලාස් ක්‍රිෂ්ණ බොගාටි පියතුමා අනාවරණය කරයි.

නේපාලයේ රතු කුරුස සමාජය කරිටාස් නේපාල ආයතනයෙන් මළ සිරුරු බහාලන බෑග් දහසක් ඉල්ලා ඇති අතර බේදවාචකයට ගොදුරුව පස්යට වැළලී ඇති සිරුරු වලින් හමන දුගඳ බරපතල සෞඛ්‍ය ප්‍රශ්නයක් ඉදිරියේදී ඇති කිරීමට ඉඩකඩක් මතුවෙමින් පවතින්නේ යැයි ගරු පියතුමා අනතුරු අඟවා සිටී. අනාගතයේදී මෙබඳු විපත් වලක්වා ගැනීම සඳහා නේපාලය සහ චීනය ඒකාබද්ධව සංනිවේදන රටාවන් වැඩි දියුණු කිරීමටත්, ග්ලැසියර් තොරතුරු හිමකුණාටු අනතුරු සහ ගංගාවල ජලමට්ටම් පිළිබඳව යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් සිටී. අති උතුම් XIV ලියෝ ශුද්ධෝත්තම පියතුමා නේපාලයේ බේදවාචකය වෙනුවෙන් හා විපතට පත්වූවන් වෙනුවෙන්ද යාච්ඤා කරමින් නේපාල ජනතාවට ආධාර උපකාර කිරීමට සියලු දෙනාට ආරාධනා කළේය.

ශීරාන් මෛත්‍රි